**දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතිය සහ දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල - 2018**

------------------------------------------------------------------------------------------------------------------------

දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ සහ දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදලේ ("ව්‍යාපෘතිය") 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වන ජපාන බැංකුව, වර්තමානයේ අන්තර්ජාතික සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය අතර 2008 ජූලි 29 දින එළඹි අංක එස්එල්-පී 94 දරන ණය ගිවිසුමේ III වාවස්ථාවේ 4(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ සහ දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදලේ මෙහෙයුම් පිළිබඳව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළියෙල කර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මෙම වාර්තාව නිකුත් කෙරේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ සහ දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදලේ ණය ගිවිසුමට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දිළිඳු ජනතාවගේ ආදායම් මට්ටම වැඩි දියුණු කිරීම හා ආදායම් ඉපයීමේ ක්‍රියාකාරකම් සඳහා ණය සැපයීමෙන් ඔවුන් සඳහා විධිමත් මූල්‍ය සේවා පුළුල් කිරීම, සහභාගිත්ව මූල්‍ය ආයතන හා හවුල්කාර නියෝජිතායතනවල කළමනාකරණ හා පුහුණු ධාරිතාව වැඩි දියුණු කිරීම සහ ප්‍රතිලාභීන්ගේ ආදායම් ඉපයීමේ අවස්ථා වැඩි කිරීම හා කුසලතා වර්ධනය කිරීම මඟින් දිළිඳුකම පිටුදැකීමට සහායවීම, ප්‍රාදේශීය අසමානතා අවම කිරීම සහ සාමය ගොඩනැංවීමට උපකාරීවීම ව්‍යාපෘතියේ අරමුණු වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය ජපන් යෙන් මිලියන 2,759 කට සමාන රු. මිලියන 3,076 ක් වන අතර ඉන් ජපන් යෙන් මිලියන 2,575 කට සමාන රුපියල් මිලියන 2,704 ක් අන්තර්ජාතික සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 ජනවාරි ආරම්භ කළ අතර 2013 දෙසැම්බර් අවසන් කිරීමට නියමිත විය. එබැවින් දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය 2013 මැයි 10 ආරම්භ කර 2018 ජූලි 14 දක්වා වසර 05 ක කාලපරිච්ඡේදයක් සඳහා ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණි.

**1.3 මතය**

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්සාධනය සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර කළමනාකරණය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.
ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

2018 දෙසැම්බර් 31 දිනට අරමුදල් සපයා ගැනීම හා උපයෝජනය පිළිබඳව වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යනය කිරීමට එකඟ වූ වටිනාකම | | වියදම් සඳහා සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ ප්‍රතිපාදන | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2018 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් (මිලියන) | රුපියල් (මිලියන) | රුපියල් (මිලියන) | ජපන් යෙන් (මිලියන) | රුපියල් (මිලියන) | ජපන් යෙන් (මිලියන) | රුපියල් (මිලියන) |
| ණය සපයන ආයතනය | 2,575 | 2,704 | - | - | - | 2,562 | 3,470 |
| ශ්‍රී.ලං.ර. | - | 372 | 32.45 | - | 15.10 | - | 308 |
| එකතුව | 2,575 | 3,076 | 32.45 | - | 15.10 | 2,562 | 3,778 |

## 3. හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | බලපෑම (රු.) | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| රුපියල් මිලියන 2.83 ක හානිකරණ පාඩුවක් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට හඳුනාගෙන තිබෙන බව නිරීක්ෂණය වූ අතර ප්‍රතිවර්තන ප්‍රති මිලදී ගැනීම්වල නියැලී සිටින ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු විසින් මහ බැංකුව සමඟ ඇතිකරගෙන තිබෙන ගිවිසුම කඩකිරීම හේතුවෙන් 2019 ජනවාරි කල්පිරෙන ප්‍රතිවර්ත ප්‍රතිමිලදී ගැනීම් ආයෝජනයන් සම්බන්ධයෙන් එකතුව රුපියල් මිලියන 40.53 ක ප්‍රතිපාදනයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සිදුකර තිබුණි. | 40,537,679 | අදහස් දක්වා නැත | ප්‍රතිවර්තන ප්‍රති මිලදී ගැනීම්වල ආයෝජනයන් සඳහා ඇති සුරැකුම්පත්වල ප්‍රමාණවත්බව පරීක්ෂා කිරීම අවශ්‍ය වේ. |